ආරම්භය: 1945-09-30 ලි.ප. අංකය: කෙ 39/482
දෙහිවල, සුදර්ශන පාරේ, ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි දෙහිවල බෞද්ධෝදය ස
මතින් ධර්ම දානම පිණිස සෑම පුර පසළොස්වක පොහෝ දිනයක්
පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය



"ධම්මො හවේ රක්ඛති ධම්මචාරී"

72වර්ෂය - ශ්‍රී බු.ව 2560 | 2017 මාර්තු 12 | මැදින් කලාපය

## සිරුර දරකඩකි

### ශාස්ත්‍රපති
### පූජ්‍ය ඌරුගමුවේ අස්සජි හිමි

අචිරං වතයං කායො
පඨවිං අධිසෙස්සති
ඡුද්ධො අපෙතවිඤ්ඤාණො
නිරත්ථං'ව කලිංගරං

මෙවර බෞද්ධෝදය සඳහම් පත්‍රිකාව සඳහා මාතෘකා කරගත් ඉහත ගාථා ධර්මය සඳහන්ව ඇත්තේ ධම්මපදයෙහි චිත්ත වග්ගයෙහිය. එහි සාමාන්‍ය අර්ථය නම් **''මේ සිරුර නොබෝ කලෙකින් ඒකාන්තයෙන් පහ වූ සිතැතිව ඉවත ලන ලදුව, දිරා ගිය දඬු කඩක් මෙන් පොළොව මත හෝනේය''** යනුයි.

බුදුරජාණන් වහන්සේ මෙය දේශනා කොට වදාළේ පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේ අරභයාය. ධම්මපදට්ඨ කථාවෙහි එන එහි නිධාන කතාව සද්ධර්මරත්නාවලී කතුවර ධර්මසේන හිමියෝ ඉතා සිත්ගන්නා සුළු බස් වහරකින් ඉදිරිපත් කරති. ඒ අනුව සද්ධර්මත්නාවලියහි එම කතා පුවත දැක්වීමෙහි පරමාර්ථය ලෙස සඳහන් කොටස සරල සිංහලෙන් මෙසේ ඉදිරිපත් කළ හැකිය.

''ජීවිතය විදුලි රේඛාවක් මෙන් බොහෝ කල් නොපවත්නා ආකාරය ද, ගිණිය නොහැකි තරම් විශාල අවුරුදු සංඛාවක් ජීවත් වුවත් ජල බිංදුවක් සේ ඉක්මනින්ම නැති වී යන ආකාරය ද, තණ කොළයේ කෙළවර ඇති පිනි බින්දුවක් සේ ආයුෂ අවසානවීමේ දී නැති වී යන ආකාරය ද, ජලයෙහි ඇඳි ඉරක් සේ මැකී යන ආකාරය ද දක්වන්නා වූ අපි පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේගේ චරිත කතාව ඉදිරිපත් කරමු.''

සැවැත්නුවර වාසය කළ එක් කුල දරුවෙක් බුදුරදුන් දෙසූ බණ අසා පැහැදී පැවිදි උපසම්පදාව ද ලබා ගත්හ. උන්වහන්සේ ප්‍රකට වූයේ ''තිස්ස'' යන නමිනි. ටික කලක් ගත වීමෙන් පසු උන් වහන්සේගේ ශරීරයෙහි මරණයෙන් මිස ප්‍රතිකාර කිරීමෙන් සුව කළ නොහැකි රෝගයක් ඇති විය. එය සිදු වූයේ මෙසේය. මුලින්ම  අබ ඇට තරම් කුඩා බිබිළි මතු වී පසුව ඒවා මුං ඇට තරම් ද, මෑ ඇට තරම් ද, නෙල්ලි ගෙඩි තරම් ද, අවසානයේ දී බෙලි ගෙඩි තරම් ද විශාලත්වයට පත් විය. ඒවා පැසවා පැළී හිල් වන්නට ද වූ අතර මුළු ශරීරයම වෙයන් කෑ පරුඬැල් කොළයක් සේ කුඩා සිදුරු හා ඊටත් කුඩා සිදුරු වලින් යුක්ත විය. එතැන් සිට උන් වහන්සේ ''පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ'' යැයි ප්‍රසිද්ධ වූහ. පසුව දවස් කිහිපයකින් ශරීරයේ ඇට බිඳුණි. එබැවින් බැලීමටත් අපහසු වූ අතර පෙර වූ සිවුරු සැර වලින් හා ලේ වලින් යුක්තව පුස් කෑ පැණි යොදා සාදන කැවුම් මෙන් පෙනෙන්ට විය. ශිෂ්‍යයොත් උන් වහන්සේ දෙස බැලීමට ඇති අපහසුකම නිසා අත්හැර ගියහ. එබැවින් උන්වහන්සේ කිසිවෙකු ගේ පිහිටක් නොමැතිව ඇඳටම සීමා වී වැතිර සිටියහ.

එකල බුදුරදුන් ගේ නුවණ නමැති දැල තුළට ශරීරය කුණු වී ගියත් රහත්වීමට හේතුවන පිනින් අඩු නො වූ පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ පෙනුණු සේක. භික්ෂූන් වහන්සේත් සමග එහි වැඩමවා පළමුව රෝගී තෙරුන් වහන්සේ ඇඳ පිටින්ම ඔසවාගෙන ස්නානය කරන තැනට ගෙන ආහ. සිවුරු සේදීමට දමන ඔරුවක් ගෙන්වා ගෙන උණු වතුර එයට වත් කොට තෙරුන් වහන්සේ පොරවා ගෙන සිටි  සිවුරු ඉවත් කොට ඒවා උණු වතුරෙන් සේදූහ. පසුව බුදුරදුන් රෝගී තෙරුන් ළගටම වී තමන් වහන්සේගේ අතින්ම උණු වතුර වත් කරවා ඇඟ අත ගා නැවූ සේක. තෙරුන් වහන්සේ ද නිරෝගී භාවයට පින නැතත්, ශක්‍ර බ්‍රහ්ම ආදීන් ගෙන් පවා අත් පා සේදීම් ආදී උපස්ථාන ලබන බුදුරදුන් ගෙන් එම උපස්ථාන ලැබීමට තරම් පින ඇති බැවින් එම දිය නැවීම ලබමින් වැඩ හුන්හ. දිය නාවා අවසන් වූ විට සේදූ සිවුරු වේලී තිබිණ. ඒවා ගෙන අවුත් උන් වහන්සේට පෙරවීමෙන් පසුව සැරව කුණු ඉවත් වී ශරීරය සැහැල්ලු බවට පත් වූ හෙයින් සිත එකග කොට ගෙන ඇඳෙහි වැතිර සිටියහ.

බුදුරජාණන් වහන්සේ රෝගී තෙරුන්ගේ හිස සමීපයෙහි වැඩ සිටිමින් උණු වතුර නාවා ඉන් පසව ආහාර අනුභව කිරීමක් කරවන්නාක් මෙන් මෙසේ දෙසූහ.

''මහණෙනි, ලී දඬු වලින් ප්‍රයෝජන ඇති මිනිස්සු කැලෑවට ගොස් ඇද නැති ලී ඇද නැතුවම ද, ඇද ලී ඇද ඇතුවම ද කපා ගෙන සිදුරු තිබෙන ස්ථාන, දිරීමට පත් වූ ස්ථාන, ගැටිති සහිත ස්ථාන කපා එතැනම දමා යත් ද, පසුව දඬු හා ලෑලි සොයා ගෙන පැමිණ කෙනෙක් ගැලපෙන දඬු හා ලෑලි කපාගෙන යන නමුත් කපා දැමූ දඬු හා ලෑලි එපරිද්දෙන්ම රැගෙන නොයත් තවත් එයින් යටට තැබීමට ගන්නා ලී කැබලි ආධාරකයට

ප්‍රයෝජනයක් ඇති නමුත් මෙම ආත්මභාවයේදී ශරීරයේ ඇති කුණු කොටස් තිස් දෙකින් එක කොටසක් හෝ පාද ආධාරකයකට යනාදී වූ කිසිම දෙයකට ගැනීමට නොහැකි හෙයින් කපා දැමූ දඬු කැලි ආදිය තරම් වත් ප්‍රයෝජනයක් නැත. එම නිසා මේ සිරුරෙහි රූප අරූප ජීවිතය ද නැති වන්නා සේ සැප පහසු අගනා ඇඳන් වල නිදා සිටිය ද වළ දැමීම යනාදිය මහ පොළොවේම වන බැවින් වැඩි කල් යාමට පෙර අත්හැර දැමූ ලී කැබැල්ලක් මෙන් මහ පොළොවටම පැමිණෙයි.

සෑම දෙයකටම සිරුර උචිත නොවෙතත් සිත දුබල නොවී පවත්නා නිසා මේ ආකාර වූ කිලිටි ආත්මභාවය දිගටම පවතියි. ශරීරයේ කෙස්, ලොම්, නිය, දත් හා හම යන අංග පහ හැර ඊට වඩා වෙනත් කුණු කොටස් නැති දිව්‍ය ආත්මභාව හා බ්‍රහ්ම ආත්මභාවයන් ද නොමැතිවීම නිසා සසර අවසන් කිරීමටම උත්සාහ කල යුතුය. මෙම දේශනාව අවසානයේදී පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේ අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන වශයෙන් ඇති දැනීම උපදවා රහත් බව ලැබ කෙලෙස් වලින් හටගන්නා රෝගයෙන් ද සුවපත් වී ආයුෂ ප්‍රමාණය ද අවසන් වූ බැවින් පිරිනිවන් පෑහ. තවත් බොහෝ පිරිසක් නිවන් දුටුවහ බුදුහු උන් වහන්සේගේ සිරුර ආදාහනය කරවා අවසානයේ ධාතු ලබා ගෙන චෛත්‍යයක් ද කර වූහ.

සෙසු භික්ෂූන් වහන්සේලා ''ස්වාමිනි, තෙරුන් වහන්සේ මෙතරම් දැඩි දුකකින් පීඩා විඳ ශරීරයේ වේදනාව බලවත් වූ බැවින් මරණය සිදුවන විට පැවැති සිතේ පිරිසිදුකම කෙසේද? කවර නම් තැනෙක ඉපදුණ සේක් දැයි, විමසූහ. බුදුහු උන්වහන්සේ පිරිනිවන් පා වදාළ බව දේශනා කලහ. රහත් වූ බැව් අසා ස්වාමීනි, රහත්වීමට තරම් සුදුසු මෙබඳු වූ පින් තිබිය දිත් සිරුර කුණු වූයේ ඇයි? සිරුරේ ඇට සියල්ල බිඳී ගියෙත් ඇයි? රහත් භාවයට පත්වීමත් කෙසේ සිදු වී දැයි විමසූහ. ''මහණෙනි, මේ සියල්ලක්ම වෙනත් අයෙකු විසින් කරන ලද දෙයක් නොමෙයි. තම තමන් විසින්ම කළ දේවල් යැයි, බුදුහු පැහැදිලි කලහ. පසුව කර්මයේ ස්වාභාවය අසා දැන ගනු කැමැතිව සිටි භික්ෂූන් වහන්සේලාට මෙසේ වදාලහ. ''මහණෙනි, මේ තෙමේ කාශ්‍යප බුදුරදුන් කාලයෙහි පක්ෂීන් අල්වා බැඳ විකුණා ජීවත්වීම සිදු කරන වැදි පවුලක ඉපදී මොනර, කුකුළු ආදී වූ පක්ෂීන් අල්වා ගෙන නොමරා ඇතිදැඩි කිරීම සඳහා බොහෝ දෙනාට දෙයි. පක්ෂීන් ඉතිරිව ඇත්නම් මරා මස් කන්නවුන්ටත් විකුණයි. විකුණා ඉතිරි වූ පක්ෂීන් ඉතිරිව ඇත්නම් මරා තැබූ විට නරක් වන නිසා පියඹා යාමට නොහැකි වන ආකාරයට කකුල් ඇට ආදිය බිඳ දමා විකුණයි. ඉතා වැඩියෙන් පක්ෂීන් ලැබුණි නම් ඔහු ද පිසවාගෙන කයි.

මොහුට එක් දිනක් මස් ව්‍යඤ්ජනයක් පිසූ විට පිඬු සිගා හැසිරෙන රහත් තෙරුන් වහන්සේ නමක් මොහුගේ නිවසට වැඩම කලහ. ඔහු උන්වහන්සේ දැක පැහැදීමට පත්ව ''ආපොයි, බොහෝමයක් පර පණ නැසීම සිදු කෙළෙමි. තෙරුන් වහන්සේද මාගේ නිවසට පිඬු සිගා වැඩම

කළහ. නිවසෙහි මස් ව්‍යාංජනයක් ද ඇත. මස් ව්‍යංජනයෙන් යුක්තව ආහාරයක් දානය පිණිස දෙමි''යි, අදහස් කෙළේය. පසුව තෙරුන් වහන්සේට ඇරයුම් කොට පාත්‍රය අතට ගෙන මස් ව්‍යංජනයෙන් යුක්ත ආහාර පාත්‍රය පිළිගන්වා උන් වහන්සේට දෙදණ, දෙඅත නළල යන ශරීර අංග පස බිම තබා නමස්කාර කොට ''ස්වාමීනි, ඔබ වහන්සේ ලත් නිවන නමැති රසය මා දුන් මස් ව්‍යංජන රසයේ ප්‍රධාන විපාකයෙන් මට ද වේවා'' යි, ප්‍රාර්ථනා කෙළේය රහත් තෙරුන් වහන්සේත් එය එසේම වේවායි වදාළහ. ''මහණෙනි. ඒ කාලයෙහි පක්ෂීන් ගේ ඇට බිඳ දැමූ ලෙසටම මොහුගේ සිරුර කුණු විය. ඇට බිඳී ගියේය. රහතන් වහන්සේට දුන් දානයේ ආනිසංසයෙන් නිවනෙහි රසය ලැබුයේය'' යි වදාළ සේක.

මෙම පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේගේ කතා පුවතෙන් සිරුරෙහි ඇති නිස්සාරත්වයත්. කර්ම විපාකයේ බිහිසුණු බවත් මනාව වටහා ගත හැකිය. එබැවින් මේ ගැන මනා නුවණින් වටහාගෙන අකුසලයෙන් දුරුව කුසල් දහම් රැස් කරගනිමින් ඉතා අපහසුවෙන් ලබා ගත් මෙම මනුෂ්‍ය භවයෙන් මෙලොව පරලොව වශයෙන් උභයාර්ථ සංසිද්ධිය සලස්වා ගැනීමට සැමෝම නොපමවා උත්සාහවත් විය යුතුය.

<u>විශේෂ නිවේදනය</u>

මෙම මාසික දහම් පත්‍රිකාව මාස්පතා ඔබ නිවසට ගෙන්වා ගත හැක.
ඒ සඳහා වැඩි විස්තර අප සංගමයේ ලිපි හුවමාරු ලිපිනය වන ලේකම් දෙහිවල, බෞද්ධෝදය සංගමය.
අංක 26 සී, දම්සත් සෙත් සෙවන, සුබෝධාරාම පාර, දෙහිවල. යන ලිපිනයෙන් විමසන්න.
දුරකථනය 0112728779 / 0112718070

**මුද්‍රණය හම්ති ග්‍රැෆික්ස්- නො. 06 සුබෝධාරාම පාර, දෙහිවල.**